**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - පළමු සෙමෙස්තරය - 2021/2022**

**PSC -3146 - ජනවාර්ගිකත්වය, ජාතිය සහ ජාතික රාජ්‍යය**

**කාලය : පැ. දෙකයි (02)**

ප්‍රශ්න **තුනකට ( 03 )** පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය **විස්සකි (20).**

---

01. i. ජනවාර්ගිකත්වය පිළිබඳ සංකල්පය ඔබ නිර්වචනය කරන්නේ කෙසේ ද?
    ii. ජනවාර්ගිකත්වය මානව වර්ගය (race) සමඟ සසඳන්න.

02. i. ජාතිය (Nation) පිළිබඳ සංකල්පයේ දේශපාලන සහ සංස්කෘතික පදනම විභාග කරන්න.
    ii. ජාතිය සැලකිල්ලට ගනිමින් ජාතිකවාදය පිළිබඳ සංකල්පය විග්‍රහ කරන්න.

03. නූතන ජාතික රාජ්‍යයේ නිශ්පත්තිය, මූලික ලක්ෂණ සහ නව ප්‍රවනතා විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

04. පශ්චාත් යටත් විජිත රටවල ජාතික රාජ්‍යයන් නිර්මාණය වීම යුරෝපා ජාතික රාජ්‍යයන්ගෙන් කොතරම් දුරට වෙනස් ද? පැහැදිලි කරන්න.

05. i. ජාතිය ගොඩනැගීම යනු කුමක් ද?
    ii. යුරෝපා නොවන රටවල දී ජාතිය ගොඩනැගීම සාමය ගොඩනැගීම ලෙස භාවිතා වන්නේ කෙසේ ද?

06. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පහත සඳහන් තේමා විමසන්න.
    i. නිදහසින් පසු රාජ්‍යය ගොඩනැගීමේ ස්වභාවය
    ii. සුළු ජාතික ගැටළුව ජාතික ප්‍රශ්නයක් ලෙස

**********************